MONEY
&
FINANCIAL INSTITUTIONS
(Part-VI)

S. Madushanka

B.Sc (Mgt) Accounting (Special) (U.G)

University of of Sri Jayewardenepura

චෙක්පත්

ජංගම ගිණුම් හිමියකු (අණකරු) විසින් එහි සඳහන් මුදල නම සඳහන් පුද්ගලයාට (ආදායකයාට) හෝ රැගෙන එන අයෙකුට ගෙවන ලෙස බැංකුවට (අණලදුට) කරනු ලබන ලිඛිත නියෝගය චෙක්පතක් ලෙස හැඳින්වේ.

චෙක්පතකට සම්බන්ධ ප්‍රධාන පාර්ශ්ව

අණකරු (Drawer) - ගිණුම් හිමියා

අණලදු (Drawee) - ගිණුම පවත්වා ගෙන යන වාණිජ බැංකුව

ආදායකයා (Payee) - චෙක්පතෙහි නම සඳහන් පුද්ගලයා, චෙක්පතෙහි සඳහන් මුදල ලැබීමට හිමිකම ලබන්නා

ClassWork.LK

චෙක්පතක මූලික ලක්ෂණ

චෙක්පතක මූලික ලක්ෂණ



1. දිනය

2. බැංකුවේ නම හා ශාඛාවේ නම

3. ආදායකයාගේ නම

4. හෝ රැගෙන එන්නාට යන යෙදුම

5. චෙක්පතේ වටිනාකම අකුරෙන් හා ඉලක්කමෙන්

6. ගෙවනු යන පදය

ClassWo

7. අණකරුගේ අත්සන

8. චුම්භක අක්ෂර හැඳුනුම් තීරය (මෙහි පිළිවෙලින් චෙක්පත් අංකය, බැංකුවේ අංකය, ශාඛාවේ අංකය හා ගිණුම් අංකය සඳහන් වේ)

9. චෙක්පතේ පිළිපත

ClassWork.LK

චෙක්පත් වර්ග

ප්‍රධාන වශයෙන් චෙක්පත් වර්ග දෙකකි.

ධාරක චෙක්පත් (භාරක චෙක්පත්) (Bearer cheques)

චෙක්පතෙහි මුද්‍රිත ව ඇති "හෝ රැගෙන එන්නාට" යන පදය කපා නො හැර ඇති චෙක්පතකි. පිටසන් කිරීමකින් තොර ව හුදු භාර දීමෙන් ධාරක චෙක්පත පැවරිය හැකි අතර බොහෝ දුරට මුදල් නෝට්ටුවකින් ගනුදෙනු කිරීම හා
සමාන වේ.

විධාන චෙක්පත් (Order cheques)

හෝ රැගෙන එන්නාට යන පදය කපා හැර හෝ ඒ වෙනුවට "විධානයට" යන්න ලියා ඇති චෙක්පත් වේ.

මෙවැනි චෙක්පතක් පැවරීමේ දී පිටසන් කිරීම අවශ්‍ය වේ. ධාරක චෙක්පතකට වඩා විධාන චෙක්පත්වල ආරක්ෂාව වැඩි ය.

ClassWork.LK

චෙක්පතක් ලිවීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු

- ලිවීමේ දී නො මැකෙන තීන්ත වර්ගයක් භාවිත කළ යුතු ය.

- පිළිපතේ අදාළ විස්තර සටහන් කළ යුතු ය.

- ලිවීමේ දී සිදු වන වැරදි තනි ඉරකින් කපා අණකරුගේ සම්පූර්ණ අත්සන යෙදිය යුතු ය.

- එක ම භාෂා මාධ්‍යයක් භාවිත කළ යුතු ය.

- අණකරුගේ අත්සන නියමාකාරයෙන් යෙදිය යුතු ය.

- චෙක්පතකට යොදන දිනය හා එහි ආරක්ෂාව සඳහා ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳ ව සැලකිලිමත් විය යුතු ය.

- හිස් චෙක්පතකට අත්සන් නො යෙදිය යුතු ය.

ClassWork.LK

චෙක්පත් රේඛනය (Crossing the cheques)

චෙක්පතක මුහුණත හරහා සමාන්තර රේඛා දෙකක් ඇඳීම හෝ වාණිජ බැංකුවක නමක් සඳහන් කිරීම චෙක්පත් රේඛනය කිරීම ලෙස හඳුන්වයි.

චෙක්පතකට සම්බන්ධ ඕනෑ ම පාර්ශ්වයකට රේඛනයක් සිදු කළ හැකි අතර, යොදන ලද රේඛනයක් අවලංගු කළ හැක්කේ චෙක්පතේ අණකරුට පමණි.

චෙක්පත් රේඛනයේ අවශ්‍යතාව

- චෙක්පතට අමතර ආරක්ෂාවක් සැලසීම
- චෙක්පතෙහි සඳහන් වටිනාකම එහි ආදායකයාට ලැබීම සහතික කිරීම
- බැංකු කවුන්ටරයෙන් මුදල් ලබා ගැනීම වැළැක්වීම

ClassWork.LK

රේඛන වර්ග

- සාමාන්‍ය රේඛනය
- විශේෂ රේඛනය

සාමාන්‍ය රේඛනය (General crossing)

වගන්ති සහිත ව හෝ රහිත ව චෙක්පතේ මුහුණත හරහා සරල සමාන්තර රේඛා දෙකක් ඇඳීම සාමාන්‍ය රේඛනය ලෙස හැඳින්වේ.



ClassWork.LK

විශේෂ රේඛනය (Special crossing)

සරල සමාන්තර රේඛා දෙකක් සහිත ව හෝ රහිත ව චෙක්පතක මුහුණත හරහා වාණිජ බැංකුවක නමක් සඳහන් කිරීම විශේෂ රේඛනය වේ. මෙවැනි චෙක්පත්, රේඛනයේ නම සඳහන් බැංකුවේ ගිණුමක තැන්පත් කළ යුතු ය.



ClassWork.LK

''ගනුදෙනු කළ නො හැකි ය''

චෙක්පතක රේඛනය තුළ "ගනුදෙනු කළ නො හැකි ය" යන පදය යෙදීමෙන් අදහස් වන්නේ මෙවැනි චෙක්පතක් පිටසන් කර පැවරිය හැකි බවත්, එම චෙක්පත පැවරීමේ දී පැවරුම්කරුට තිබූ අයිතියට වඩා වැඩි අයිතියක් පැවරුම්ලාභියාට හිමි නො වන බවත් ය.

එම නිසා මෙවැනි රේඛනයක් යෙදූ චෙක්පතක් ලබා ගැනීමේ දී පැවරුම්ලාභියා එම චෙක්පතට පෙර තිබූ අයිතීන් පිළිබඳ සැලකිලිමත් විය යුතු බව ඇඟවේ.

''ආදායකයාගේ ගිණුමට පමණයි''

චෙක්පතක රේඛනය තුළ "ආදායකයාගේ ගිණුමට පමණයි" යන පදය යෙදීමෙන් අදහස් වන්නේ චෙක්පතෙහි නම සඳහන් ආදායකයාගේ ගිණුමට තැන්පත් කිරීමෙන් පමණක් මුදල් කර ගත හැකි බවයි. මෙය පැවරීම සීමා කෙරෙන රේඛනයකි.

''රු. 5 000 ක් දක්වා පමණයි''

චෙක්පතක රේඛනය තුළ "රු. 5 000 ක් දක්වා පමණයි" යනුවෙන් මුදල් සීමාවක් යෙදීමෙන් අදහස් වන්නේ සඳහන් ව ඇති මුදල් ප්‍රමාණයට වඩා වැඩියෙන් චෙක්පතේ වටිනාකම සඳහන් නො විය යුතු බවයි.

ClassWork.LK

චෙක්පත පිටසන් කිරීම (Endorsement)

චෙක්පතෙහි මුහුණත සඳහන් වන ආකාරයට ම ආදායකයා සිය නම චෙක්පතෙහි පිටුපස ලිවීම චෙක්පත පිටසන් කිරීම ලෙස හැඳින්වේ. (චෙක්පත දරන ඕනෑ ම අයෙකු චෙක්පත පැවරීමේ දී ඔහුගේ නම ලිවිය යුතු ය.) චෙක්පත නීත්‍යානුකූල ව පැවරූ බව සනාථ කිරීම පිටසන මගින් සිදු වේ.

පිටසන යෙදීම අවශ්‍ය වන අවස්ථා

- ආදායකයා විසින් චෙක්පත බැංකුවෙහි තැන්පත් කිරීමේ දී

- විධාන චෙක්පතක් නම් අන් අයෙකුට පවරන අවස්ථාවේ දී

- රේඛනය නො කරන ලද චෙක්පත් බැංකු කවුන්ටරයට දී මුදල් ලබා ගැනීමේ දී

ClassWork.LK

චෙක්පත් අගරු වීම (Dishonour of cheques)

ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් කළ චෙක්පතකට මුදල් ගෙවීම බැංකුව විසින් ප්‍රතික්ෂේප කිරීම චෙක්පතක් අගරු වීම ලෙස හැඳින්වේ.

චෙක්පතක් අගරු වන අවස්ථා

- ගිණුමේ ප්‍රමාණවත් මුදල් නො මැති වීම
- අණකරු විසින් ගෙවීම නතර කර තිබීම
- අණකරු බුන්වත් වීම
- අණකරු මරණයට පත්වීම හා ඒ බව බැංකුවට දැනුම් දී තිබීම
- ගානිෂි නියෝගයක් ලැබීම (උසාවි නියෝගයක්)
- ලිඛිත වැරදි
- ගිණුම වසා තිබීම

ClassWork.LK

අභ්‍යාස

චතුර බණ්ඩාර යන අයට රු. 10 000 ක මුදලක් ඔබ විසින් ගෙවිය යුතු ව ඇතැයි උපකල්පනය කරන්න. ඔබගේ ජංගම ගිණුම මහරගම ලංකා බැංකු ශාඛාවේ ද, චතුර බණ්ඩාරගේ ජංගම ගිණුම අනුරාධපුර මහජන බැංකු ශාඛාවේ ද පවත්වා ගෙන යයි. ඉහත මුදල අද දින චෙක්පතකින් ගෙවීමට අදහස් කරයි. චෙක්පතක ආකෘතියක් ඇඳ උපරිම ආරක්ෂාව සැලසෙන පරිදි අදාළ චෙක්පත ලියා දක්වන්න.

ClassWork.LK

2021
2022
2023

උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

තනි හෝ කණ්ඩායම් පන්ති
(English & Sinhala Medium)

0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura